# කරණීය මෙත්ත සූත්‍රය

(සූත්‍ර පිටකය, ඛුද්දක නිකාය, සුත්ත නිපාතය, උරග වග්ගය)

| | |
|---|---|
| ***කරණීය මත්ථ කුසලේන්***[2] | ඒ ශාන්ත පදය වන “අමා නිවන” ට පැමිණ වාසය කිරීමට |
| ***යං තං සන්තං පදං අභිසමෙච්ච***[1] | කැමති අයෙකු විසින්[1] ඒ සඳහා ඇති කර ගත යුතු කුසලතා[2]; |
| ***සක්කෝ*** | (කුටි සෑදීම සිවුරු මැසීම පඬු පෙවීම පාත්තර සකස් කිරීම ආදී)සියළු කටයුතු වල දක්ෂයෙක් විය යුතුයි |
| ***උජූ ච*** | ඍජු (අවංක) කෙනෙක් විය යුතුයි |
| ***සූජූ ච*** | ඉතා අවංක කෙනෙක් විය යුතුයි |
| ***සුවචෝ චස්ස*** | කීකරු කෙනෙක් විය යුතුයි |
| ***මුදු*** | මෘදු හිතැත්තෙක් විය යුතුයි |
| ***අනතිමානී*** | අධික මාන නැත්තෙක් විය යුතුයි |
| ***සන්තුස්සකෝ ච*** | ලද දෙයින් සතුටු වන කෙනෙක් විය යුතුයි |
| ***සුභරෝ ච*** | පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් විය යුතුයි |
| ***අප්පකිච්චෝ ච*** | අඩුවෙන් වැඩ කටයුතු ඇත්තෙක් විය යුතුයි |
| ***සල්ලහුකවුත්තී*** | සැහැල්ලු පැවතුම් ඇත්තෙක් විය යුතුයි |
| ***සන්තින්ද්‍රියෝ ච*** | දමනය කළ, සන්සුන් ඉඳුරන් ඇත්තෙක් විය යුතුයි |
| ***නිපකෝ ච*** | තැනට සුදුසු නුවණ ඇත්තෙක් විය යුතුයි |
| ***අප්පගබ්භෝ*** | හැඩිදැඩි අසංවරගති නැත්තෙක් විය යුතුයි |
| ***කුලේසු අනනුගිද්ධෝ*** | හිතමිත්‍ර කුලපවුල් වල නොඇලෙන්නෙක් විය යුතුයි |
| ***න ච ඛුද්දං සමාචරේ කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං*** | නුවණැත්තන් නින්දා කරන ඉතා සුළු වරදක් වත් නොකරන අයෙක් විය යුතුයි |

(මෛත්‍රිය වඩන ආකාරය)

| | |
|---|---|
| ***සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා*** | සියළු සත්වයෝ සුවපත් වෙත්වා භය නැත්තෝ වෙත්වා සැප ඇති සිත් ඇත්තෝ වෙත්වා |
| ***යේ කේචි පාණභූතත්ථි***[3] ***තසා වා***[1] ***ථාවරා වා***[2] ***අනවසේසා***[4] | කෙලෙස් සහිත වූ[1] ද, කෙලෙස් රහිත වූ ද[2], යම් සත්ව පිරිසක් ඇද්ද[3] ඒ සියළුම දෙනා ද[4] |
| ***දීඝා වා යේ මහන්තා වා*** | දිග සත්තු ද මහත ශරීර ඇති සත්තු ද |
| ***මජ්ඣිමා රස්සකාණුකථූලා*** | මධ්‍යම ප්‍රමාණයේ සත්තු ද මිටි සත්තු ද ඉතා සියුම් සත්තු ද ස්ථූල සත්තු ද |
| ***දිට්ඨා වා යේව අද්දිට්ඨා*** | ඇසට පෙනෙන සත්වයෝ ද ඇසට නොපෙනෙන සත්වයෝ ද |
| ***යේ ච දූරේ වසන්ති අවිදූරේ*** | දුර වාසය කරන සත්වයෝ ද ළඟ වාසය කරන සත්වයෝ ද |
| ***භූතා වා සම්භවේසීවා*** | ඉපදී සිටින සත්වයෝ ද ඉපදෙමින් සිටින සත්වයෝ ද |

| | |
|---|---|
| ***සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා*** | සියළු සත්වයෝ සුවපත් වෙත්වා! |
| ***න පරෝ පරං නිකුබ්බේථ*** | කිසිවෙක් කිසිවෙකුට (රැවටීම් ආදියෙන්) හිංසා නොකෙරේවා! |
| ***නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි*** | කිසි තැනකදී කිසිවෙක් කිසිවෙකුට අවමන් නොකරත්වා! |
| ***බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා*** | නුරුස්නා ක්‍රියාවෙන් හෝ නපුරු සිතුවිල්ලෙන් හා වචනයෙන්, |
| ***නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය*** | ඔවුනොවුන්ට දුකක් කැමති නොවෙත්වා! |
| ***මාතා යථා නියං පුත්තං*** | තම ජීවිතය මෙන් පුතු සුරකින |
| ***ආයුසා ඒකපුත්තමනුරක්ඛේ*** | එකම පුතෙකු ඇති මව් විලසින් |
| ***ඒවම්පි සබ්බභූතේසු*** | සියළු සත්ත්වයන් කෙරෙහි |
| ***මානසං භාවයේ අපරිමාණං*** | අප්‍රමාණ වූ මෙත් සිත පැතිර විය යුතුය |
| | |
| ***මෙත්තං ච සබ්බ ලෝකස්මිං***[7] | උඩ ද[1] යට ද[2] හරහට ද[3] සීමාවක් නැතිව[4] වෛර සිත් |
| ***මානසං භාවයේ අපරිමාණං***[8] | නැතිව[5] සතුරු බාධා නැතිව[6] සියළු ලෝකය කෙරෙහි[7] |
| ***උද්ධං***[1] ***අධෝ ච***[2] ***තිරියඤ්ච***[3] | අප්‍රමාණ වූ[8] මෙත් සිත පැතිරිය යුතුය. |
| ***අසම්බාධං***[4] ***අවේරං***[5] ***අසපත්තං***[6] | |
| | |
| ***තිට්ඨං චරං නිසින්නෝ වා*** | සිටගෙන සිටින විට ඇවිදින විට හෝ හිඳගෙන සිටින විට ද |
| ***සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ*** | නිදාගැනීමට ගිය විට හා නින්ද යන තුරු ද |
| ***ඒතං සතිං අධිට්ඨෙය්‍ය*** | මේ මෛත්‍රී සහගත සිත අධිෂ්ඨානයෙන් සිහි කළ යුතුය |
| ***බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු*** | එසේ විසීම බ්‍රහ්මවිහරණය යි කියනු ලැබේ |
| ***දිට්ඨිං ච අනුපගම්ම සීලවා*** | (මෙසේ කරන තැනැත්තා) කිසිදු මිථ්‍යා දෘෂ්ටීයන් හි නොඇලී |
| | සිල් ගුණ ධර්ම දියුණු කරගෙන |
| | |
| ***දස්සනේන සම්පන්නෝ*** | සොතාපණ්ණ මාර්ගය දකිනා නුවණින් යුතුවී |
| ***කාමේසු විනෙය්‍ය ගේධං*** | කාමයන් ට ඇති ඇල්ම දුරු කොට |
| ***නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතී ති.*** | නැවත මව් කුසක බැසගැනීමට කිසි දිනක නොපැමිණේ |
| | (පිරිණිවන්පානු ලැබේ) |